3 වන පිටෙන්

අංශ ප්‍රධානියෙකු ජාත්‍යන්තර යුද අධිකරණයට රැගෙන යෑමේ හැකියාව තිබේද? එය මේ මොහොතේ ශ්‍රී ලාංකීය සමාජය තුළ ඉස්මතු වී ඇති ප්‍රශ්නයකි.

එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන්නේ ශ්‍රී ලාංකීය කිසිම රාජ්‍ය නායකයෙකු හෝ හමුදා ප්‍රධානියෙකු ජාත්‍යන්තර යුද අධිකරණයට රැගෙන යාමට නොහැකි බවය. එහි ගැළවුම්කාරයා තමන් බව ඔහු කියා සිටී.

කිසියම් රටක රාජ්‍ය නායකයෙක් හෝ හමුදා නිලධාරියෙක් මානව හිමිකම් උල්ලංඝණය කිරීමේ චෝදනාව යටතේ ජාත්‍යන්තර යුද අධිකරණයට රැගෙන යාමට නම් අනිවාර්යෙන්ම ඊට අදාල ''රෝම'' ප්‍රඥප්තියට අත්සන් කළ යුතු බව රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කර සිටී.

1999 දී ඉතාලියේ රෝම නගරය කේන්ද්‍ර කරගෙන පිහිටවූ මෙම ප්‍රඥප්තීන්ට මේ වනවිට රටවල් 93 ක් අත්සන් තබා ඇත. 2001 ජූලි මස පළමු වැනදා රැස්වූ සමුළුවේදී මෙම රෝම ප්‍රඥප්තියට ශ්‍රී ලංකා අත්සන් තැබිය යුතු වුවත්, එයට කිසිදු ශ්‍රී ලංකා රාජ්‍ය නායකයෙකු හෝ නියෝජිතයෙකු අත්සන් තැබුවේ නැත.

එවැනි ස්වභාවයක් තුළ ස්විස්ටර්ලන්තයේ ජිනීවා නුවර පැවැත්වන මානව හිමිකම් සමුළුවේදී ඇමරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවට එරෙහිව කුමන මානව හිමිකම් චෝදනා එල්ල කළද, යෝජනා ගෙන ආවද, ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ පමණක් නොව, කිසිම අයෙකුව ජාත්‍යන්තර යුද අධිකරණයට රැගෙන යාමේ කිසිදු හැකියාවක් නොමැති බව රනිල් වික්‍රමසිංහ මහතා ස්ථිර අධිෂ්ඨානයෙන් යුතුව ප්‍රකාශ කරන දෙයකි.

මෙම රෝම ප්‍රඥප්තිය අත්සන් කළ 2001 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ පැවතියේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවකි. ජනාධිපතිවරයා චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග වුවත්, අගමැති ධුරය දැරුවේ රනිල් වික්‍රමසිංහ මහතාය.

එබැවින් ආණ්ඩුවේ ප්‍රධානියා වශයෙන් එවකට අගමැති ධුරය දැරූ තමා මෙම ප්‍රඥප්තියේ භයානක භාවය අවබෝධ කරගෙන එයට අත්සන් කිරීමෙන් වැළකී සිටි බව රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන දෙයකි.

ශ්‍රී ලංකාව වසර ගණනාවක් තිස්සේ කොටි ත්‍රස්තවාදයට ගොදුරුව සිටි රටකි. එවැනි ස්වභාවයක් තුළ දෙපාර්ශ්වයක් ආයුධ සන්නද්ධව සටන් වැදී සිටින අවස්ථාවක මෙවැනි ගිවිසුමකට අත්සන් කිරීම අනාගතයේ කිසියම් ප්‍රශ්න සහගත තත්ත්වයකට මුහුණපෑමට ඉඩ ඇති බැවින් එවැන්නක් අත්සන් කිරීමට තමන් නොපෙළඹුණු බව රනිල් වික්‍රමසිංහ මහතා වැඩිදුරටත් කියා සිටින කරුණකි.

ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. එල් ගුණසේකර මහතා ප්‍රකාශ කරන්නේද රනිල් වික්‍රමසිංහ මහතාට සමාන අදහසකි. එනම්, ශ්‍රී ලංකාව රෝම ප්‍රඥප්තියට අත්සන් කර නැති නිසා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සැසිවාරයේදී ඇමරිකාව ලංකාවට එරෙහිව කුමන චෝදනා එල්ල කළද, ජාත්‍යන්තර යුද අධිකරණයට කිසිදු ශ්‍රී ලාංකිකයෙකු රැගෙන යෑමේ හැකියාව නැති බව ඔහු කියා සිටී.

නමුත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙකු වන නීතිඥ ප්‍රතිභා මහානාම හා හිටපු අග විනිසුරු සරත් නන්ද ද සිල්වා මහතා දරන්නේ මීට වෙනත් අදහසකි. එනම් රෝම ප්‍රඥප්තියට කිසියම් රටක් අත්සන් කළද, නොකළද, ජාත්‍යන්තර යුද අධිකරණයට කිසියම් රාජ්‍ය නායකයෙකුව හෝ හමුදා නායකයෙකු රැගෙන යෑමේ හැකියාව ඇති බව ඔවුහු පවසති.

හිටපු අගවිනිසුරු සරත් නන්ද ද සිල්වා මහතා මේ සඳහා ගන්නා එක් උදාහරණයක් වන්නේ යුගෝස්ලෝවියාවය. එම රට රෝම ප්‍රඥප්තියට අත්සන් කර නැත.

එහෙත් වරක් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම හරහා චෝදනා එල්ල කර එම රටේ රාජ්‍ය නායකයෙකුව ජාත්‍යන්තර යුද අධිකරණයට රැගෙන ගිය බව සරත් නන්ද ද සිල්වා මහතා ප්‍රකාශ කරයි.

මෙවැනි තවත් බොහෝ උදාහරණ ඇත. එවැනි ස්වභාවයක් තුළ රෝම ප්‍රඥප්තියට අත්සන් නොකළ පළියට කිසියම් රාජ්‍ය හෝ හමුදා නායකයෙකුව ජාත්‍යන්තර යුද අධිකරණයට රැගෙන යෑමට නොහැකි යැයි ප්‍රකාශ කරන්නේ කුමන සංදර්භයක් යටතේ දැයි ඔවුහු ප්‍රශ්න කර සිටිති.

මෙහිදී අපට නීතිඥයින් වන රනිල් වික්‍රමසිංහ, ප්‍රතිභා මහානාම හෝ එස්. එල් ගුණසේකර යන මහත්වරුන්ගේ අදහස් වලටත් වඩා සරත් නන්ද සිල්වා මහතාගේ කරුණු කාරණා වැඩි වැදගත්කමක් දරනවා යැයි විශ්වාස කළ හැක. මන්ද, ඔහු ලංකාවේ වැඩිම කාලයක් නීතිපති හා අගවිනිසුරු ධුරය දැරූ නීති ක්ෂේත්‍රයේ වැඩි අත්දැකීමක් හා දැනුමක් ඇති විනිසුරුවරයෙකි. එවැනි ස්වභාවයක් තුළ සාමාන්‍යයෙන් අපට අනෙක් අයගේ අදහස් බැහැර කිරීමට නොහැකි වනවාසේම, සරත් නන්ද සිල්වා මහතාගේ තර්කයට වැඩි ඉඩකඩක් ලබාදීමට සිදුවනවා ඇත.

අප කැමති වුවත්, අකමැති වුවත්, ඇමරිකාව යනු ලෝකයේ බලවත්ම රාජ්‍යයකි. ලෝක පොලිස්කාරයා ඔහුය. නීති සකස් කරන්නේත්, නීති ක්‍රියාත්මක කරන්නේත්, තම අවශ්‍යතා උදෙසා නීති කඩන්නේත්, දඬුවම් කරන්නේත්, සියල්ල තම වාසිය උදෙසා නොපිට පෙරළන්නේත් ඇමරිකාවය.

එවැනි සමාජ පසුබිමක් තුළ ඕනෑම බලහත්කාරයක් යොදා ලෝක පොලිස්කාරයාගේ තැන සුරැකීමට ඇමරිකාව පසුබට නොවනු ඇත. ලෝකයට ඇමරිකාව හිසරදයක් වී ඇත්තේ ද එබැවිනි.

මෙවැනි තත්වයක් මත ශ්‍රී ලංකාව රෝම ප්‍රඥප්තියට අත්සන් කර තිබේද ? නැද්ද? යන්න

*ජාත්‍යන්තර දෙමළ ඩයස්පෝරාව ශ්‍රී ලංකා රණවිරුවන්ට එරෙහිව කළයුතු දෑ වර්තමානය වන විට මහින්ද රාජපක්ෂ ආණ්ඩුව සිදු කරමින් සිටී.*

ඇමරිකාවට අදාළ නොවේ. ඔවුන්ට කිසියම් අත්‍යවශ්‍ය අවශ්‍යතාවයක් ඇත්නම්, ශ්‍රී ලංකාවට එරෙහිව යුද අපරාධ චෝදනා එල්ල කර ජාත්‍යන්තර යුද අධිකරණයකට ශ්‍රී ලංකාව රැගෙන යනවා ඇත.

සැබෑ කතාන්දරය එයයි. එබැවින් මෙය පැහැදිලිව තේරුම් ගෙන ක්‍රියා කිරීම ඉතා වැදගත්ය. අප සිදුකර ඇත්තේ අපේ රටේ සාමය උදෙසා කොටි ත්‍රස්තවාදය පරාජය කිරීමකි. එය යුද අපරාධයක් නොවේ. ජනතාවගේත් රටේත් ආරක්ෂාව උදෙසා ගත හැකිව තිබූ එකම විකල්ප ක්‍රියාමාර්ගයයි.

අප රටට පමණක් නොව, මුළු ලෝකයටම ත්‍රස්තවාදියෙක් වී ඇත්තේ ඇමරිකාවය. මානව හිමිකම් උල්ලංඝණය කරන්නේ, යුද අපරාධ සිදු කරන්නේ ඇමරිකාවය. ජාත්‍යන්තර යුද අධිකරණයට රැගෙන යා යුත්තේ ඔවුන්වය.

එවැනි තත්වයක් තුළ සාමය වෙනුවෙන් නිදහස උදෙසා සටන් කළ ශ්‍රී ලංකාවේ යම් අයෙක් ජාත්‍යන්තර යුද අධිකරණයට රැගෙන යෑමට ඇමරිකාව උත්සාහ කරන්නේ නම්, එතරම් යුද අපරාධයක් ලෝකයේ තවත් නැතුවා වැනිය.

ලෝක පොලිස්කාරයාගේ දුෂ්ඨ චරිතයට පණ පොවමින් ඕනෑම යුද අපරාධයක් කිරීමේ හැකියාව ඇමරිකාවට ඇත. ඒවාට එරෙහිව කිසිදු මානව හිමිකම් උල්ලංඝණය කිරීමේ චෝදනාවක් නැත. නමුත් අප වැනි කුඩා රටක් සාමය වෙනුවෙන් සටන් කළහොත්, එය ඇමරිකාවට පෙනෙන්නේ යුද අපරාධයක් ලෙසය.

පකිස්ථාන ආණ්ඩුවේ කිසිම අනුදැනුමකින් හෝ අවසරයකින් තොරව එම රටට කඩා වැදී අල්කයිඩා සංවිධානයේ නායක ඔසාමා බිල්ලාඩින්ව පණපිටින් මරා දැමීමට ඇමරිකාවට පුළුවන.

තමන්ට තර්ජනයක් වූ ලිබියානු නායක මොහොමඩ් ගඩාෆි හා ඉරාක ජනාධිපති සදාම් හුසේන්ව අමුවේම ඉතාමත් තිරිසන් විදියට කිසිදු සදාචාරාත්මක නීතිමය රාමුවකින් තොරව මරා දැමීමට ඇමරිකන් පොලිස්කාරයාට පුළුවන.

ඊශ්‍රායලය හරහා පලස්තීන රාජ්‍යයන්ට බෝම්බ හා වෙඩි ප්‍රහාර එල්ල කර සමූහ වශයෙන් මිනිසුන් ඝාතනයට කිරීමට තුට්ටු දෙකේ ඇමරිකානු පොලිස් බල්ලාට පුළුවන තම ශක්තිය පෙන්වා උතුරු කොරියාවට, කියුබාව, වෙනිසියුලාව හා ඉරානයට තර්ජන ගර්ජන එල්ල කරමින් ගණන්කාරයෙක් ලෙස ලෝකයා ඉදිරියේ විරාජමානව වැජඹීමට ඇමරිකාවට පුළුවන

ඔවුන්ට අනුව ඒ කිසිම දෙයක් මානව හිමිකම් උල්ලංඝණය කිරීම් හෝ යුද අපරාධ නොවේ. ඒවා ඇමරිකාවේ සර්ව සාධාරණ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියා මාර්ගය. අපගේ රටේ සාමය වෙනුවෙන් කිසියම් ක්‍රියා මාර්ගයක් ගතහොත් එය වැරදිය. නමුත් ඇමරිකාව ඇතුළු බටහිර බලවතුන් තමන්ගේ පැවැත්මට මොන දහදුරා වැඩ කළද ඒ ගැන කිසිදු ප්‍රශ්නයක් නැත.

බටහිර බලවතුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදය අපූරුය. අප නම් දකින්නේ මෙය ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ සිදුවන සාධණීය ලක්ෂණයක් නොව, ප්‍රබල රටවල් විසින් දුබල රටවල් තවත් දුබල කර තම සපත්තුවට තද කරමින් කරන්නාවූ නින්දනීය තත්වයකි.

මෙලෙස කල්පනා කර බලන කළ ප්‍රජාතන්ත්‍රවාදි රාමුවට මුවාවී ඇමරිකාව හා ශ්‍රී ලංකාව කරන කියන දෑ අතර එතරම් වෙනසක් නැත. ඇමරිකාව මානව හිමිකම් චෝදනාව එල්ල කරමින් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර යුද අධිකරණයට රැගෙන යමින් මට්ටු කිරීමට උත්සාහ කරති.

ඇමරිකාවේ බැරැක් ඔබාමා එලෙස ක්‍රියා කිරීමට උත්සුක වන විට ලංකාවේ මහින්ද රාජපක්ෂ සිදුකළේ කුමක්ද? දේශප්‍රේමයට මුවාවී තම ප්‍රතිවාදියා වූ ජෙනරාල් සරත් ෆොන්සේකා මහතාට දේශද්‍රෝහී චෝදනා එල්ල කරමින් යුද්ධාධිකරණයට කැඳවා කැකිල්ලේ නඩු තීන්දුවක් හරහා ඔහුව සිරගත කිරීමට පියවර ගැනීමටය.

කොටි ත්‍රස්තවාදයෙන් රට මුදවා ගත් යුදමය නායකයා වූ ජෙනරාල් සරත් ෆොන්සේකාව හිරේ විලංගුවේ දමා ජයපැන් බීමට උත්සුක වූ මහින්ද රාජපක්ෂ තමන්ට එරෙහිව ජාත්‍යන්තර යුද අධිකරණයක ඇමරිකාව නඩු පැවරීමට ප්‍රයත්න දරන විට මරලතෝනි දී පණ බයේ කෑමොර දෙමින් රටම දෙවනත් කිරීමට පෙළඹී ඇත.

රට මුදාගත් යුදමය නායකයාවූ සරත් ෆොන්සේකාව හිරේ දමන විට මහින්ද රාජපක්ෂ මේවා ගැන නොසිතුවේ ඇයි? මේ කරන අපරාධ කවදා හෝ වෙනත් මාර්ගයකින් තමන් වෙත කැරකී ඒවියැයි නොසිතුවේ ඇයි?

අපට නම් පෙනෙන ආකාරයට ජාත්‍යන්තර දෙමළ ඩයස්පෝරාව ශ්‍රී ලංකා රණවිරුවන්ට එරෙහිව කළයුතු දෑ වර්තමානය වන විට මහින්ද රාජපක්ෂ ආණ්ඩුව විසින් සිදු කරමින් සිටී.

කොටි ත්‍රස්තවාදීන්ගෙන් රට මුදාගත් සරත් ෆොන්සේකාව මේ වන විටත් හිරේ දමා ඇත. ත්‍රස්තවාදය තුරන් කිරීමට සෘජු වශයෙන්ම නායකත්වය සැපයූ රණවිරුවන් විශාල පිරිසක් හමුදාවෙන් ඉවත් කර ඇත. විවිධ චෝදනා එල්ල කරමින් ඔවුන්ගෙන් පළි ගැනීමට පටන් ගෙන ඇත.

හරිනම් මේවා කළ යුතු වන්නේ දෙමළ ඩයස්පෝරාව විසිනි. ප්‍රභාකරන් ඇතුළු කොටි ත්‍රස්තවාදීන්ගේ හිතවත් ඒජන්තයින් විසිනි. නමුත් ඔවුන් කළයුතු දෑ අද මහින්ද රාජපක්ෂ ආණ්ඩුව සිදුකර ඇත. යුද අපරාධ වන්නේ මේවාය. මානව හිමිකම් උල්ලංඝණය වීම් කියන්නේ මේවාටය. ප්‍රභාකරන්ව මරා රටට සාමය ගෙනදුන් යුද නායකයන්ව රාජපක්ෂ බලකාය විනාශ කර ඇත.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ ජිනීවා සමුළුව හරහා මහින්ද රාජපක්ෂ මහතාව ජාත්‍යන්තර යුද අධිකරනයට රැගෙන යෑමට අප එරෙහි වනවාසේම මහින්ද රාජපක්ෂ රණවිරුවන්ට කළ අපරාධවලට පළිගැනීම් වලට අප කවුරුත් අනිවාර්යෙන්ම එරෙහි විය යුත්තේ එබැවිනි.

ශ්‍රී ලාල් ප්‍රියන්ත

